# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1871/21 – 2014 ජූලි 15 වැනි අඟහරුවාදා – 2014.07.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම් ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලය සඳහා අවශ්‍ය බවත්, ඒවා ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, බදුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ග්ලේන්ඇල්පීන් ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ රිල්පොල කෝරළේ සුළු කොට්ඨාසයේ, හංවැල්ල ගමේ පිහිටි බදුල්ල දිස්ත්‍රික්කයේ බදුල්ල කොට්ඨාසයේ මැනුම් අධිකාරී විසින් 2014.02.26 දිනැතිව සකස් කරන ලද අංක බී/ඒසීකිව්/බීඩීඑල්/2014/28 දරන පූගමන අනුරේඛනයේ කැබලි අක්ෂර 'ඒ', 'බී' සහ 'සී' වශයෙන් සඳහන් ප්‍රමාණයෙන් හෙක්. 10.1171ක් පමණ වූ හිගුරුගමුව වත්ත නමැති ඉඩම:

**01. කැබලි අක්ෂර 'ඒ' – හිගුරුගමුව වත්ත – ප්‍රමාණය: හෙක්. 0.6765**

උතුරට: මාර්ගය; නැගෙනහිරට: මාර්ගය, බලංගොඩ වැවිලි සමාගම හිමිකම් කියන ග්ලේන්ඇල්පීන් වත්ත සහ කැබලි අක්ෂර බී; දකුණට: බලංගොඩ වැවිලි සමාගම හිමිකම් කියන ග්ලේන්ඇල්පීන් වත්ත සහ කැබලි අක්ෂර බී; බටහිරට: කැබලි අක්ෂර බී සහ මාර්ගය.

**02. කැබලි අක්ෂර 'බී' – ප්‍රමාණය: හෙක්. 0.0735ක් පමණ**

**03. කැබලි අක්ෂර 'සී' – හිගුරුගමුව වත්ත – ප්‍රමාණය: හෙක්. 9.3671ක් පමණ**

උතුරට: බලංගොඩ වැවිලි සමාගම හිමිකම් කියන ග්ලේන්ඇල්පීන් වත්ත, මාර්ගය සහ කැබලි අක්ෂර බී; නැගෙනහිරට සහ දකුණට: බලංගොඩ වැවිලි සමාගම හිමිකම් කියන ග්ලේන්ඇල්පීන් වත්ත, මාර්ගය සහ රජය හිමිකම් කියන ග්ලේන්ඇල්පීන් වත්ත; බටහිරට: බලංගොඩ වැවිලි සමාගම හිමිකම් කියන ග්ලේන්ඇල්පීන් වත්ත සහ මාර්ගය.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

යොමු අංකය: එල්ඩී/05/2009/ඊ/55.
2014 ජූනි මස 23 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
"මිහිකත මැඳුර"
අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

08 - 79

1A – G 19913 – 17 (2014/07)

මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, මහරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මාකුඹුර ගමේ පිහිටි මැනුම්පති විසින් පිළියෙල කරන ලද අංක සීඕ/එම්එච්ආර්/2014/158 හා 2014.03.31 දිනැති ප්‍රගමන අනුරේඛනයේ කැබලි අක්ෂර 'ඒ' වලින් පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්. 0.3037ක් පමණ වූ පහත නමින් හා ප්‍රමාණයෙන් යුක්ත ඉඩම් කොටසට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – අකුරුතලවිට කුඹුර – ප්‍රමාණය: හෙක්. 0.3037ක් පමණ**

උතුරට: ඇළ සහ හිමිකම් කියන අය සොයාගත නොහැකි අකුරුතලවිට කුඹුර; නැගෙනහිරට සහ දකුණට: හිමිකම් කියන අය සොයාගත නොහැකි අකුරුතලවිට කුඹුර; බටහිරට: මා කුඹුර - හිරිපිටිය මාර්ගය සහ ඇළ.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

මගේ අංකය: 4-3/10/2013/යූඩීඒ/699.
2014 ජූනි මස 17 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
"මිහිකත මැදුර", ඉඩම් මහලේකම් කාර්යාලය,
අංක 1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

08 - 80

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.